## රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය (G.O.B.A)
## ''ලේකම් හා ගණකාධිකාරී'' තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

1971 අංක 27 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපිත මෙම සංගමයේ ප්‍රධාන පරිපාලන නිලධාරී වන ''ලේකම් හා ගණකාධිකාරී'' තනතුර සඳහා සුදුසුකම් සහිත රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *සුදුසුකම් :*

   1.1 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ හෝ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III නිලධාරියෙකුවීම හෝ, ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරියෙකු හෝ,

   1.2 කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි පන්තියේ නිලධාරියෙකුවීම හෝ පළමු වන පන්තියේ නිලධාරියෙකුවීම හා වසර 05ක පළපුරුද්ද සහිත ව්‍යාපාර කළමනාකරණ/වාණිජ්‍ය විද්‍යා උපාධි හෝ සමාන සුදුසුකම් සහිත වීම.

2. රාජ්‍ය සේවා හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 142 සමඟ කියවිය යුතු 143 වන රීතිය අනුව - පරිශිෂ්ට 10 ප්‍රකාර හා/හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි අයදුම්කරු ද්වීතීයන පදනම යටතේ සංගමයේ සේවයට වර්ෂ 2ක කාලයක් සඳහා මුදා හැරිය හැකි බවට සේවා ප්‍රධානී හෝ පත්වීම් බලධාරී හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ (සංවෘත සේවා) ලිඛිත එකඟතාවය අනිවාර්යයෙන්ම ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

3. තනතුරට හිමි ප්‍රතිලාභ :

   3.1 රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේදී ලබාගත් සම්පූර්ණ වැටුප නොඅඩුව

   3.2 ප්‍රවාහන දීමනා හැර තනතුරට හිමි දීමනා

   3.3 තනතුරට නියමිත වැටුප් ක්‍රමයේ උපයාගෙන ඇති/පිහිටුවා ඇති මූලික වැටුපෙන් 35% සමාන අතිරේක දීමනාවක්

   3.4 රාජ්‍ය සේවයේ හිමි නිවාඩුවලින් ලබානොගත් නිවාඩු සඳහා දීමනා ඊළඟ වර්ෂය ආරම්භයේදී.

   3.5 මහා සභාවේ එකඟතාවය මත එක් ලිත් මසක වැටුපට සමාන ප්‍රසාද දීමනා (වෙනස් විය හැක.) (කරුණාකර රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් නොවන පුද්ගලයන් අයදුම් කිරීමෙන් වළකින්න.)

4. පොදු කොන්දේසි :

   4.1 කොළඹ නගරයට සැතපුම් 35ක් තුළ ස්ථිර පදිංචිය.

   4.2 2020.07.24 දිනට වයස අවු. 55 නොවැඩි වීම.

   4.3 රාජ්‍ය සේවයේ අවු. 15කට නොඅඩු සේවා කාලයක්

   4.4 ගිණුම් කටයුතු පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

   4.5 පරිගණක සාක්ෂරතාවය හා Internet හා E-mail භාවිතා කිරීමේ හැකියාව

   4.6 සිංහල භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව.

2020 අගෝස්තු මස 24 වැනි දින මධ්‍යාහ්න 12.00 ට පෙර ලැබෙන සේ ඔබ විසින් සකස් කරගත් ඉල්ලුම් පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානි මඟින් (ඉහත 2 අනුව නිදහස් කළ හැකි බවට සහතික කර) පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එන්. එම්. විජේරත්න,
සභාපති.

2020 ජූලි මස 24 වැනි දින,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය,
අංක 65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02
දුරකථන අංකය : 011-2434598, 2473633

07-530

Source: Government Gazette (2020.07.24)